# සංචාරක කර්මාන්තයේ තිරසර සංවර්ධනයක් උදෙසා රජ රට පළාතේ පුරාණ වැව් ගමක මෙහෙය

**සචින්ත දේශාන් රාජපක්ෂ**

Sachintha80@gmail.com

0721256055

## පිවිසුම

මහාචාර්ය ජෙන්කින් පවසා ඇති පරිදි සංචාරක කර්මාන්තය යනු ''සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා සිතූ පැතූ සම්පත් ලබා දෙන කප් රුකකි' ශ්‍රී ලංකාව සංවර්ධනය කරා යන ගමනේදී සංචාරක ව්‍යාපාරය මගින් දැවැන්ත පිටුවහලක් අපේක්ෂිතය. සංචාරක කර්මාන්තය දියුණු කිරීම සඳහා ශ්‍රී ලාංකික උරුමය වඩා නිර්මාණාත්මකව ධරනීය ආකාරයට භාවිතයට ගැනීම සඳහා කාලය දැන් එළඹ තිබේ. පවතින සාම්ප්‍රදායික උරුමයක් එලෙසින්ම අඩ සියවසකට ආසන්න කාලයක් සංචාරක ව්‍යාපාරය ඉදිරියට ගෙන එන්නට සිදු කල මෙහෙය සුලු පටු නොවේ. නමුත් සංචාරක ව්‍යාපාරයේ සංවර්ධනය උදෙසා විවිධත්වයෙන් යුතු ආකර්ශන මගින් සංචාරකයින් ගෙන්වා ගැනීමට මෙරට අපගේ සාම්ප්‍රදායික උරුමයන් සහ ස්වාභාවික සම්පත් ආරක්‍ෂා කරමින්, සංරක්ෂණය කරමින් ධරනීය ලෙස සංචාරක ව්‍යාපාරය උදෙසා යොදා ගැනීමට මෙහිදී බලාපොරොත්තු වෙමු. ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික වැව් ගම්මාන සහිත ජලාශ්‍රිත ශිෂටාචාරය සංචාරක සැමරුමේදි තේමාව වූයේ ද, සංචාරක කර්මාන්තය සහ ජලය, ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික වැව් ගම්මානයක් ප්‍රතිනිර්මානය කිරීම සඳහා අනුරාධපුර දිස්ත්‍රික්කයේ රිටිගල ආශ්‍රිත වැව් ගම්මානයක් ආදර්ශයක් සේ යොදාගෙන මෙම අධ්‍යනය සිදුකරනු ලබයි.

## පර්යේෂණයේ අරමුණු

1. බිඳ වැටුණු සාම්ප්‍රදායික වැව් ගම්මානය නැවතත් පුනර් සංවර්ධනය කරමින් පැරණි වැව් ගම්මානය සංස්කෘතිය නැවතත් ගොඩ නැන්වීම.
2. වැව, කෘෂිකර්මය, පරිසරය හා බැඳුන ශ්‍රී ලංකාවේ පැරණි උරුමය ආරක්ෂා කිරීම
3. විවිධත්වයෙන් යුතු සංචාරක ආකර්ශන සංචාරක වෙළෙඳ පොලට ඉදිරිපත් කිරීම.

## ක්‍රමවේදය

සාහිත්‍ය කෘති විමර්ශනය සහ ක්ෂේත්‍ර චාරික මගින් තොරතුරු රැස් කිරීම.

## විමර්ශනය: සාම්ප්‍රදායික වැව් ගම්මානයක් යනු

''වියලි කලාපයේ රජ රට ප්‍රදේශ වල වැව කේන්ද්‍ර කරගෙන වැව් දියවරෙන් කෘෂිකර්මාන්තයෙන් ජීවත්වෙන මිනිසුන් සිය සාමාජික, සංස්කෘතික සහ පාරසරික ක්‍රියාකාරකම් සහ සාම්ප්‍රදායන් සිදුකරන කලාපයක්'' ලෙස සරලව අර්ථ දැක්වීමට පුලුවන.

## සාම්ප්‍රදායික වැව් ගම්මානයක් උරුමයක් වන්නේ කෙසේද?

මහා දියවරක් මත ගොඩ නැගුන ශිෂ්ටාචාරයක හිමිකරුවන් වන, සිංහලයන් සහ ඔවුන්ගේ වසර 2500 ඉතිහාසයේ වාරි

ශිෂ්ටාරය සහ එහි අංග තාක්ෂණය, සංස්කෘතිය ආදී සමස්තය අපගේ උරුමය වේ. එම උරුමය කලමනාකරමය කරමින් ධරනීය ලෙස යොදාගනිමින් සංචාරක ව්‍යාපාරය සංවර්ධනය සඳහා යොදා ගැනීම මෙහිදී සිදු කෙරේ.

## හැඳින්වීම

වියලි කලාපයේ කෘෂි කාර්මික ජනාවාස වල පැවැත්මට වසර 2500 කට වඩා දීර්ඝ ඉතිහාසයක් තිබේ. පැරනි සමාජය හේන, කුඹුරල වැව යන ප්‍රධාන අංග වලින් සමන්විත වේ. වැව් ගම්මාන වල වැසියන් ස්වාභාවිකත්වය තුලින්ම සියල්ල අපබෝධ කරගත් අත්දැකීමෙන් උගත් පිරිසක් විය.

මෙම පැරණි වැව් ගම්මාන පිහිටා තිබුනේ වැව් ආශ්‍රය කරගෙනය වැව් කන්ඩියේ කෙලවරකට වන්නටය. වැව් ගම්මානයේ නිවාස පිහිටා තිබුණේ එක පොකුරක් ලෙසිනි. ආරක්ෂාව සහ සාමූහික බව රැක ගැනීමද තවත් හේතුවක් විය. මෙම ජනාවාස වල ප්‍රධාන ජීවනෝපාය වූයේ ගොවිතැනයි. ඔවුහු වියලි කලාපයේ දේශූණයට ගැලපෙන පරිදි බෝග වර්ග යොදා ගත්හ. ඒ අනුව ගොවිතැනට මුල්තැනක් ලැබී තිබුන මෙම ගොවි ගම්මාන වල කේන්ද්‍රයේ වැව පිහිටා තිබූ අතර වැවට පහත් බිම් කොටස් වී ගොවි තැනට ද වැව් ඉහත්තාව වනාන්තර සඳහා වෙන් කර තිබුනි. ගැමි ආර්ථිකයේ ජීවරුධිරය වශයෙන් වැවේ ජලයයි. වැව් ගම්මාන වැසියන්ගේ ජීවන කටයුතු රඳා පවතින්නේ ප්‍රධාන වැවේ ජලය මතයි. වැව ආශ්‍රිත කුඹුරුත් වැවේ ජලය ප්‍රමාණයත් අදාල ජනාවාසයේ ප්‍රමානය තීරණය කරයි. එසේ වැව් ගම්මාන වල වැසියන්ට අවශ්‍ය ජලය, මසුන්, පැලෑටි වර්ග, අල වර්ග, බෙහෙත් යනාදී බොහෝ දේ ලබා ගත්තේ වැවෙනි. වැව් ඉහත්තාවේ ඇත්තෙ වන පෙතයි. වැව් ගම්මාන වැසියෝ එය ආරක්ෂා කලහ. දර, මස්, පොතු, ගෙඩි, කොල, මල්, ඖෂධ ලබාගනු ලැබුවේ එයිනි. ගව සම්පත ඔවුන්ගේ කෘෂි කාර්මික කටයුතු වලට යොදාගත් අතර ගවයන් සඳහා ආහාර වැව් පිටියෙන් සහ වගානොකල කුඹුරු වලින් යොදාගනු ලැබීය. ගවයන් ගෙන් පස්ගෝරස ලබා ගන්නා ලදී. ඔවුන් ස්වයං පෝෂිත ආර්ථිකයකට උරුමකම් කී අතර තමන්ගෙ ජීවන පැවැත්ම උදෙසා අවශ්‍ය දේ වගා කරගත්හ නැතහොත් හුවමාරු කර ගත්හ. සහජීවනය සහ සාමූහිකත්වය මත ඔවුන්ගේ ජීවිත පැවතුනි. සියල්ල අනුකරනයෙන් පරපුරෙන් පරපුරට හිමිවිය. මෙම උරුමයෙන් ලත් දායාදයන් පාරම්පරිකත්වය තුල පදනම් වී ශක්තිමත්ව තිබුණි.

මේ නිසා වැවේ ජලය යනු වැව් ගම්මාන වල ජීව රුධිරය විය. ලෝක සංචාරක වෙලඳ පොල තුල ශ්‍රී ලංකාව සමග තරග කරන රටවල් වන්නේ මාලදිවයින, ඉන්දියාව, තායිලන්තය, මැලේසියාව, භූතානය, වැනි රටවල්ය. එම රටවල් හා සසඳන විට ශ්‍රී ලංකාව සතු නමුත් තරගකාරී රටවල දක්නට නොමැති ජලාශ්‍රිත ශිෂ්ටාචාරය ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරයට ගෙන එන්නේ ධනාත්මක අගයකි. ඒ අනුව ජලාශ්‍රිත ශිෂ්ටාචාරය සංචාරක ව්‍යාපාරය සම. බද්ධකර ගැනීම තුලින් ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය ඉහලට ඔසවා තැබීමට හැකියාව ලැබේ. ජලාශ්‍රිත ශිෂ්ටාචාරය, සංචාරක ව්‍යාපාරය සමග බද්ධ කිරීම යනු හුදෙක් සංචාරකයන්ට වැවක් නැරඹීමට රැගෙන යාමක් නොවේ. දියවර මත ගොඩ නැගුන ශ්‍රී ලංකාවේ ජලාශ්‍රිත ශිෂ්ටාචාරය බහු විධ වූ ස්පර්ශ කර එමගින් ධරණීය වින්දනයක් ලැබීමට සංචාරකයන්ට අවස්තාව ලබාදීමයි.

## සංචරනය සහ පුරාණ වැව් ගම්මාන

වර්තමානය වන විට ලෝක සංචාරක වෙලඳ පොල තුල පුලුල් අවධානයකට ලක් වී තිබෙන නව සංචාරක ප්‍රවනතාවය වන්නේ රූ දෙස් සංවරනයයි. රූ දෙස් සංවරනය අර්ථ දක්වා ඇත්තේ වගකීමකින් යුතුවල පරිසරය ආරක්ෂා කරමින් සංචාරනය කිරීමත් එමගින් ප්‍රජාවට ප්‍රතිලාභ ලැබීමට සැලැස්වීමත් ය. රූ දෙස් සංචාරකයන් බොහෝමයක් අධ්‍යාපන අතින් ඉහල මට්ටමක සිටින්නන් වන අතර නව සංස්කෘතින් පිලිබඳ හැදෑරීම සහ ඒවාට හානියක් නොවන අයුරින් ඒ සම්බන්ධ අත්දැකීම් ලබන්නට රුචි පිරිසක් වන අතර ඔවුන්ට මූලික අවශ්‍යතා තෘප්ත වීම පමණක් ප්‍රමාණවත් වේ

මෙම සාම්ප්‍රදායික වැව් .ම්මාන ව්‍යාපෘතිය මගින් පැරණි වැව් ගම්මාන සංස්කෘතිය හා බුඳුන් සියල්ල අත් විඳීමට, ස්පර්ශ කිරීමට

රූ දෙස් සංචාරකයන්ට අවස්ථාව ලැබෙනු ඇත. එපමණක් නොව ලොව අන් කිසිඳු ජන රටක දක්නට නොමැති සිංහල වාරි ශිෂ්ටාචාරයට අයත් වාරි තාක්ෂණය, සමාජ රටාවන්, වැව් ගම්මාන ජන ජීවිතය, වැව් ගම්මාන වැසියන්ගේ ආහාර පාන රටාවන්, ඇඳුම් පැළඳුම්, ජන ක්‍රීඩා, පංසල, බුදු දහම, සමග ගැමි ජීවිත සම්බන්ධ වන අයුරු ග.ැමියන්ගේ ජීවනෝපායන් කුඹුර හා බැඳුන සියලුම සංස්කෘතික ලක්ෂණ, තාක්ෂණය, ගෘහ නිර්මාණ ශිල්ප ක්‍රම, අපේ මුතුන් මිත්තන් පරිසරයට අනුගතව කියා කල අයුරු පරිසරය ආරක්සා කරන අයුරු අපගේ වැව් ගම්මාන සංස්කෘතිය ධරණීය අන්දමට සංචාරකයාට අත්විඳීමට සැලැස්වීමයි. මෙය හුදෙක් සරල ක්‍රියාදාමයක් නොවේ. සංකීර්ණ ක්‍රියාදාමයකි. නමුත් එහි ස්වර්ණමය ඵලය ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරයට පමණක් නොව ප්‍රජාවට, පරිසරයට ආදී සෑම අංශයකටම ලැබේ.

## නිගමනය

දෙස් සංචරනය යටතේ සාම්ප්‍රදායික වැව් ගම්මානයක් සහිත ව්‍යපෘතිය සංචාරක ව්‍යාපාරය සමඟ සම්බන්ධ කරමින් ධරනීය ආකාරයෙන් සංවර්ධනය කල හැකි බව නිගමනය කල හැක.මෙම ව්‍යාපෘතිය මගින් වාරි ශිෂ්ටාචාරය ප්‍රතිනිර්මාණය කිරීමක් සිදුවේ. මෙමගින් ලෝක සංචාරක වෙළඳ පොලේ ශ්‍රී ලංකාව සමග තරග කරන රටවල් අභිබවා යෑමට හැකිවනු ඇත. සංචාරක කර්මාන්තය යටතේ සාම්ප්‍රදායික වැව් ගම්මානයක සිදු කල හැකි ක්‍රියාකාරකම් අතර සාම්ප්‍රදායික කාබනික ගොවිතැන ඒ හා බැදුන සියල්ලල වැව් ගම්මානය සංස්කෘතියට අදාල ක්‍රියාකාරකම්, ආහාර පාන, ක්‍රීඩා හා බැඳුන සියල්ල, වැව් ගම්මානයක සිරිත් විරිත් විශ්වාස ඇදහිලි සංචාරකයන්ට අත් විඳින්නට ඉඩ සැලසීම, ජල ක්‍රීඩා, පා පැදි සංචාර පා ගමන්, බුදු දහම සහ භාවනා වැඩසටහන්ල ජල තාක්ෂණයල වී වර්ග පැරණි දේ අඩංගු කෞතුකාගර, කුරුල්ලන් නැරඹීම, වැනි අංශ පවතී.

## ආශ්‍රෙය ග්‍රන්ථ


ගුණවර්ධන ප්‍රිශාන්ත, 2004, පුරාණ ගම, සමන්ති පොත් ප්‍රකාශකයෝ.

ඇඳගම, පණ්ඩුල, 1985 ගැමි ගෘහ නිර්මාණ, මහවැලි වංශය, 11 කාණ්ඩය මහවැලි සංවර්ධන අංශය, කොළඹ.

පොඩි අප්පුහාමි, කේ. බී. රජ රටින් ගිලිහෙන .ැමි ජීවන රටා, 2002.

දළුපොත මහින්ද කුමාර, වී බිස්ස, 1997

තෙන්නකෝන් ධර්මරත්න, ගොවි තැන හා අපේ සංස්කෘතිය, 2010.